


# 『නැවුම් වූ ජීවිතයකට』

**නිච්කෝ නිවානෝ, ප්‍රධානී රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

## ‘මුළු ලෝකයේම සතුට උදානොවන තාක්කල්, තනි පුද්ගලයෙකුගේ සතුට උදානොවීම’ හොඳින්ම දැනෙයි



සුබ නව වසරක් වේවා.

අවුරුදු දෙකක සිට නව කොරෝනා වෛරසය අපගේ එදිනෙදා ජීවිතයට විශාල බලපෑමක් එල්ලකර තිබෙනවා. ළඟදී සිට ජපානය තුල කොරෝනා ආසාදිතයන් එක්වර අඩුවීමක් පෙන්නුම් කලත්, ලෝකයේ පුරා ආසාදිතයන් එන්න එන්නම වැඩිවීමක් දකින්න ලැබෙන රටවල්ද තිබෙනවා. එබැවින් නිතරම සැලකිලිමත්ව, කොරෝනා ආසාදනයෙන් වැලකී සිටිමට උත්සහ ගනිමු.

ජපානය පුරා ධර්ම ශාඛා වසා තිබුනත්, අප සංවිධානයේ සාමාජිකයන් නිතරම අන්‍යන් ගැන සිතන නිසා දුරකතනයෙන්, ලියුම් හා විද්යුත් තැපැල් මාර්ගයෙන් සාමාජිකයන් ගැන සොයාබලා තෙදොරි කිරිම නොකඩවා සිදුකලා. ඒ වෙනුවෙන් ඔවුනට හිසනමා ආචාර කරනවා. මෙම කොරෝනා ව්‍යසනය වඩා වැදගත්ම දේ කුමක්දැයි, අධ්‍යනය කිරීමට මිනිසුන්ට ලබාදී ඇති අනගි අවස්ථාවක් යැයි මම මීට කලින්ද පැවසුවා.

කොරෝනා ආසාදනය විශාල ලෙස ව්‍යාප්ත වන කාලය තුලදී පවා, ‘මේ පුද්ගලයා හොඳින් ඉන්නවාද’, ‘ජීවිතයට කරදරයක් නැතිද’, ‘දරුවන් හොඳින් සිටිනවාද’ ලෙසින් අන්‍යයන් ගැන සිතීම, මනුෂ්‍යයන් ලෙස අපතුල තිබිය යුතු වැදගත්ම හැඟීමකි. ඒ හැඟීම තව තවත් පුළුල් කරගෙන එදිනදා ජීවිතය දෙස පසු විපරම් කර බැලීම තුලින්, ජීවිතයෙන් ඉවත්කල යුතු කාරණා තිබෙන බවද අවබෝධ වේ.



ජපන් භාෂාවේ ‘省’ (ෂෝ) කන්ජි අකුරේ, අත් හැරීම හා පසුවිපරම් කර බැලීම ලෙස අරුත් දෙකක් තිබෙන බවද ගිය වසරේ මම පැවසුවා. වසර දෙකක කාලයක පවතින මෙම කොරෝනා වෛරසය තුලින්, අත්හල යුත්තේ මොනවාද, පසු විපරම් කල යුත්තේ මොනවාද යනවග අපි එකිනෙකාට හොඳින්ම පැහැදිලි කරගැනීමට හැකිවුනා යැයි සිතමි.

මෙම කොරෝනා ව්‍යසනය ජපානය තුල හොඳින් පාලනය වූවත්, අනෙකුත් රටවල ආසාදිතයන්ගේ ව්‍යාප්තිය නොකඩවා සිදුවුවහොත්, නැවත වතාවක් ජපානයද එම අවධානමට නිරාවරණය වෙනවා.

එමනිසා ජපානයේ සුප්‍රසිද්ධ සාහිත්‍යධරයෙකු වන කෙන්ජි මියසාවා මහතා පැවසූ ‘මුළු ලෝකයේම සතුට උදනොවන තාක්කල්, තනි පුද්ගලයෙකුගේ සතුට උදනොවේ’ යන කරුණ මේ අවධියේ හොඳින්ම දැනෙයි. මෙතුමාගේ වදන්, බුදුන් වහන්සේගේ මහා මෛත්‍රියේ නූතන වදන් ලෙසින් භාරගෙන අපි සැවොම එය නැවත නැවත ආවර්ජනය කරමු.

මෙම කරුණු කාරණා පදනම් කරගනිමින්, ‘2022 වර්ෂයේ අරමුණ’ මා විසින් මෙසේ පෙළගැස්වුවා.

මෙම වසරේ අප සංවිධානයට 84 වන සංවත්සරය උදාවනවා සේම, නිර්මාතෘ තුමාගෙන් පසුව, මම සංවිධාන ප්‍රධානීත්වය භාරගෙන 30 වන වසර සම්පූර්ණ වෙනවා.

මේ වසරේදීත් සංචරණ සීමාවන් පවතීවි යැයි අපේක්ෂා කරන අතරම, කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය ගැන විමසිල්ලෙන්, නියම ආගමික ජීවිතයක් ගත කරමින්, එකිනෙකා අඹු සැමියන් ලෙස, අම්මා හා තාත්තා ලෙස, දෙමාපියන් ලෙස, අනාගතය භාර ගන්නට සිටින තරුණයන්ට හා කුඩා දරුවන්ට, කුමන ආකාරයේ අධ්‍යාපනයක් ලබා දෙනවාද, කුමන ආකාරයට ආධ්‍යාත්මය පරිපූර්ණ කරනවාද, පවුල සමග බැඳීම කුමන ආකාරයට පවත්වා ගන්නවාද යන්න හා තම රටේ සම්ප්‍රදාය රැක ගනිමින්, කුමන ආකාරයට යහපත් රටක් ස්ථාපිත කරනවාද යන කරුණු ගැන නිර්මාණාත්මකව මෙන්ම ගැඹුරින් සිතමින් කටයුතු කල යුතුය.

ගිය වසරේදීත් නව වසරේ පණිවුඩය තුලින් සඳහන් කල පරිදි, අඹු සැමියන් ලෙස තරුණ පරම්පරාව ගැන දක්වා ඇත. අම්මා හා තාත්තා ලෙසින් මැදිවියේ පරම්පරාව ගැන හා දෙමාපියන් ලෙස වැඩිහිටි පරම්පරාවේ පිරිස ගැන සඳහන් කර ඇත. මේ සැවොම මානව සම්පත් දියුණු කිරීම යන මූලික අරමුණ ඉලක්ක කරගෙන උපරිම කැපවීමෙන් කටයුතු කිරීම අප සංවිධානයට පමණක් නොව, සමාජයට මෙන්ම රටටද ඉතා වැදගත් වේ.

එහි පදනම වන්නේ, පවුල තුල ලබා දෙන අධ්‍යාපනයයි. පවුල නියමාකාරයෙන් පිලිවෙලට තබා ගැනීමෙන්, හොඳ මානව අධ්‍යාපනයක් හා විනයක් ඇති වී, පාසලෙන් ලැබෙන අධ්‍යාපනයද වඩා ඵලදායි වී, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ‘මානව සම්පතක්’ බිහිකර ගැනීමට හැකියාව ලැබෙයි.

එසේම, පවුල නියමාකාරයෙන් පිලිවෙලට පවත්වා ගැනීමට නම්, ‘බුදු මැඳුර මූලික කරගත් ධර්මානුකූල ජීවිතයක් පවත්වා ගැනීම’ හා ‘ත්‍රිවිධ පුහුණුව’ ඉතා වැදගත් බව පැවසුවා. එම ත්‍රිවිධ පුහුණුව නම්, පවුල තුල උදෑසන කරන සුභාෂිංන, කවුරු හෝ ආමන්ත්‍රණය කල විට ‘ඔව්’ ලෙසින් පිලිතුරු දීම හා සපත්තු සෙරප්පු පිලිවෙලට තැබීම වේ. මෙම මූලික කරුණු සාමාජිකයන් වන අපි නිතරම වැදගත්ව සලකා කටයුතු කලා.

## විශිෂ්ට රටක් නිර්මාණය කිරීමේ ප්‍රාර්ථනය හා ඒ වෙනුවෙන් කටයුතු කිරීම, එකිනෙකා නිර්මාණාත්මකව හා උනන්දුවෙන් සිදු කරමු

මේ ආකාරයට ළමා හා තරුණ පිරිසගේ සංවර්ධනය සමගම ‘2022 වර්ෂයේ අරමුණ’ ලෙසින්, ‘තම රටේ සම්ප්‍රදාය රැක ගනිමින්, කුමන ආකාරයට යහපත් රටක් ස්ථාපිත කරනවාද’ යන කරුණද එකතු කරණු ලැබුවා.

එය තම රටේ සම්ප්‍රදාය හොඳින්ම භාවිතයට ගනිමින්, ලෝකය පුරා තිබෙන නොයෙකුත් වගකීම් ඉටුකිරීමට වැදගත් යැයි සිතමි.

වර්තමාන ලෝකය දෙස බලන විට, තම රටට මුල්තැන දීමේ සිතුවිල්ල වඩා ශක්තිමත් වී ඇත. ඒ තුල තම රටේ සම්ප්‍රදායන් හොඳින් භාවිතා කරමින්, ලෝකයේ ඇති එක් රටක් වශයෙන් නොයෙකුත් භූමිකාවන් ඉටුකිරිම හැකිවේ යැයි සිතමි.

ඒ වෙනුවෙන් තම රට හොඳින් ශක්තිමත් විය යුතුය. විශිෂ්ට රටක් බිහිකිරීමේ ප්‍රාර්ථනය හා ඒ වෙනුවෙන් කටයුතු කිරීම, දේශපාලකයන්ට පමණක් භාර නොදී, රට වැසියන් වන අපි එකිනෙකාද හදවත් විවර කරමින්, නිර්මාණාත්මකව හා උනන්දුවෙන් කටයුතු කරමු.

## 'හදවත හා මනස සංවර්ධනය කිරීම' යන වදනින්, තමා ගැන හොඳින්ම දැන ගැනීමට හැකිවේ

ඉහත සඳහන් කල පරිදි, ගිය වසරේ නොවැම්බර් මස 15 වෙනිදට නිර්මාතෘ තුමාගෙන් පසුව මම සංවිධානය ප්‍රධානීත්වය භාරගෙන වසර 30 ක් වුනා. නැවත හැරී බලද්දී, වසර 30 ක් ගතවුනාදෝ කියා සිතෙනවා.

සංවිධාන ප්‍රධානීත්වය භාරගත් විට මම පැවසුවේ, 'එක පෙළට, සැවොම එක්වී ගමන් කරමු' කියාය.

සාමාජිකයන් එකිනෙකා තුල, එක හා සමානව බුද්ධ ශක්තිය ගැබ්වී තිබෙනවා. මමත් ඒ සියළුදෙනා හා සමානවම, එක් බෝධිසත්වයන් කෙනෙකු සේ, මේ බුද්ධ මාර්ගයේ ඇවිද යාමට කැමතියි, යන අරුතයි එහි අඩංගුවී තිබුනේ.

මම සංවිධාන ප්‍රධානීත්වය භාරගෙන ඊට පසු අවුරුද්ද වන 1992 වන වර්ෂයේදී 'නැගම් යාම' යන නමින්, ජපානය පුරා තිබෙන ධර්ම ශාඛාවන් 130 කට ගොස් සාමාජිකයන් සමඟින් සුහදව කටයුතු කලා.

අපි හැමෝම, එකිනෙකා එකට සම්බන්ධ වෙමින්, පැවතෙමින් හා නොයෙකුත් බලපෑම් ලබමිනුයි ජීවත්වන්නේ. තවත් පුළුල්ව බලනවා නම්, මේ විශ්වයේ තිබෙන සෑම සියළු දෙයක්ම අපගේ නෑදෑයන් සේ පැවසිය හැකිවේ. ඒ අතරින් වඩාත් සමීප හා හදවත් එකට බද්ධ වී සිටින නෑදෑයන්වන්නේ, සාමාජිකයන්ය. එම නිසයි ධර්ම ශාඛාවලට ගොස් සාමාජිකයන්ව හමුවීම 'නැගම් යාම' ලෙසින් හැඳින්වුවේ.

'නැගම් යාම' යන වදන ඇසුන නිර්මාතෘ තුමා, 'නෑදෑයන් ලෙසින් සාමාජියන් හැඳින්වීම විශිෂ්ටයි', 'ළඟකදී සිට නිවිකෝ ආසාවෙන් ධර්ම ශාඛාවන්ට යනවා' ලෙසින් ඉතා සතුටට පත්වී තිබුනා. ඒ වගේම 'මීට වඩා ටිකක් කලින් සංවිධාන ප්‍රධානීත්වය භාරදෙන්න තිබුනා' ලෙසින්ද විහිළුවට පවසා තිබුනා.

නමුත් මම සංවිධාන ප්‍රධානීත්වය භාරගෙන වසර 8 කට පසු, එනම් 1999 වර්ෂයේ ඔක්තොම්බර් මස 4 වෙනිද, වසර 92 ක් ආයු වැලඳූ නිර්මාතෘ තුමා අභාවප්‍රාප්ත වුනා. ඒ දක්වාම කුමක් හෝ දෙයක් සිදු වු විට, නිර්මාතෘ තුමාගෙන් අසා දැනගන්න පුළුවන් යන හැඟීම තිබුනා. නමුත් නිර්මාතෘ තුමාගේ අභාවය තුලින්, ස්වාධීන වී කටයුතු කිරීමට අපව දිරිමත් කරනවා සේ සිතුනා.

නිර්මාතෘ තුමාගේ කියාදීම් සැකවින් සඳහන් කරනවා නම්, දෙමාපියන්ට සැලකීම, මුතුන් මිත්තන්ට පින් අනුමෝදන් කිරීම හා බෝධිසත්ව චර්යයාව ලෙසින් නිතරම පවසා තිබෙනවා.

විශේෂයෙන්ම බෝධිසත්ව චර්යයාව යනු, ධර්මය මූලික කරගෙන කටයුතු කිරීමයි. තම බෝධිසත්ව හදවත ඉස්මතු කරගෙන, බෝධිසත්ව චර්යයාවේ ගමන් කිරීම වේ. තවත් සරළව පවසනවා නම්, දයාවෙන් හා අන්‍යයන් ගැන සිතීමේ හැඟීමෙන් කටයුතු කිරීමයි. නිර්මාතෘ තුමාටත් පැවසීමට අවශ්‍ය වුවේ මෙම කරුණ යැයි සිතමි.

නමුත් වර්තමානයේ නිර්මාතෘ තුමාගෙන් සෘජුවම උපදෙස් ලැබූ සාමාජික පිරිස ටිකෙන් ටික අඩුවී තිබෙනවා. ඉතිරිව සිටින පිරිස නිර්මාතෘ තුමාගෙන් ලැබූ උපදෙස් අනුව අවබෝධ කරගත් දේ හා දුකින් මිදුනු ආකාරයන් ගැන තවත් විශාල පිරිසකට අනිවාර්යයෙන්ම කියාදෙනු ඇතැයි බලපොරොත්තු වෙනවා.

මම සංවිධාන ප්‍රධානීත්වය භාරගත් පසු සියළුදෙනාට පැවසීමට අවශ්‍ය වුවේ, තමා තමන් ගැන හොඳින් දැනගත යුතු බවයි. අන්‍යයන් ගැන හෝ ලෝකය ගැන වාද විවාද කරන්න ඉතාම පහසුයි. නමුත් ඉතාමත් වැදගත් දේ වන්නේ, තමා ගැන හොඳින් අධ්‍යයනය කරමින්, තමා ගැන දැන ගැනීමයි.

එසේනම් තමා ගැන දැන ගැනීමට කල යුත්තේ කුමක්ද. ඒ වෙනුවෙන් මම, අප සංවිධානයේ 60 වන සංවත්සරයේ සිට 'හදවත හා මනස සංවර්ධනය' (හදවත නැමැති කෙත්යායේ බුද්ධාකුරය අස්වද්දමු) යන තේමාවෙන් යුතුව, ඔබ සැම දෙනා සමඟ මේ දක්වා ඇවිද පැමිණියා.

මනුෂ්‍යයන් බොහෝ විට, 'මේ තමයි මම' ලෙසින් සීමාන්තික වූ කුඩා තමන් ගැන තදින්ම සිතමින් හීනමානයටත්, අධිමානයත් පත්වේ. නමුත්, සත්‍යය ලෙසම ඒ තමන්මද?

බුදුන් වහන්සේද මනුෂ්‍යයෙකු ලෙස නොයෙකුත් දුක් විඳිමින්, ප්‍රශ්න වලට මුහුණ දෙමින් අවසානයේ මෙලොව සත්‍යය වූ ධර්මය අවබෝධ කර ගත්තා. එමනිසා ඒ හා සමානම මනුෂ්‍යයන් වන අපටද සත්‍යය වූ ධර්මය අවබෝධ කර ගැනීමේ මෙන්ම, ප්‍රශ්න විසඳ ගැනීමේ හැකියාව තිබෙනවා.

එබැවින් තමා කවුරුන්ද යනවග අවබෝධ කරගැනීම තුලින් මුලින්ම, තමා ඉදිරියේ ඇති ප්‍රශ්න ජය ගැනීමට හැකිව, එතැන් සිට නියම වටිනාකමින් යුතු ජීවිතයක් ගත කිරීම ආරම්භ වේ.

එමනිසා, 'හදවත හා මනස සංවර්ධනය කිරීම' යන වදන තුලින් තමා ගැන හොඳින්ම දැන ගැනීමට හැකිවේ. මේ ලෝකයේ ජීවත්වන තමන්, බුදුන් වහන්සේ හා සමාන හදවතකින් යුතු වගේම, ජීවිතයේ හා ලෝකයේ ප්‍රශ්න විසඳ ගතහැකි හැකියාවෙන් හා වගකීමෙන්ද යුතුවන බව අවබෝධ කර ගැනීම, අන් හැමදෙයටම වඩා වැදගත් වේ.

මේ කරුණ අවබෝධ කරගෙන නැවුම් වූ ජීවිතයක් ගත කරන සාමාජිකයන් මේ කාලය තුලදී වැඩිවීමක් සිදුවුනා. ඒ වාගේම නියම තමන් ගැන අවබෝධ නොකරගත් සාමාජිකයන් පිරිසද බහුලයි.

එම පිරිස තව තවත් තෙදොරි, මිච්බිකි කරමින් ධර්මයේ ආධ්‍යාත්මය හොඳින් ප්‍රතිමූර්තිමත් කල හැකි සාමාජිකයන් බවට පත්වේවායි ප්‍රාර්ථනා කරමි.

මේ වසරේදීත් කොරෝනා ව්‍යසනය නිසා නියමාකාරයෙන් සංවිධානයේ ධර්ම කටයුතු කිරීමට නොහැකිවේවි. නමුත් තමා සිටින තැන, ධර්ම පුහුණුවන ස්ථානය වන නිසා මේ මොහොත, මේ ස්ථානය, තමන් ධර්මය පුහුණුවන තැනයි යන හැඟීමෙන් යුතුව සමාජයේ කුඩාම ඒකකය වන පවුල හා අනාගතය බාරගන්නා තරුණ පරම්පරාව සමඟින් ඉදිරියටම යමු.

(2022 වසරේ ජනවාරි මස 2 වන දින 'කෝසෙයි පුවත්පත ඇසුරිනි')